# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති, ශ්‍රී ලංකාවේ "අංක 01" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා අදාළ සුදුසුකම් ඇති පළපුරුද්ද සහ කැපවීම සහිත උද්යෝගීමත් තරුණ තරුණියන්ගෙන් ලංකා බැංකුවේ නීති අංශය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී සහකාර නීති නිලධාරී

### යෝග්‍යතා නිර්ණායක

- ශ්‍රී ලාංකිය පුරවැසියෙකු විය යුතුය.
- **සුදුසුකම්**

  නීතිඥයෙකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වීම
- **පළපුරුද්ද**

  සිවිල් අංශයේ උසාවි කටයුතු, නීති කටයුතු, ඉඩම් හිමිකම් ඔප්පු සම්බන්ධව සුපරීක්ෂණ කටයුතු, නොතාරිස් වැඩ, කම්කරු හා කාර්මික උසාවි කටයුතු පිළිබඳ වසර 03 ක පළපුරුද්ද සහ පරිචය.
- **වෙනත් සුදුසුකම්**

  පරිගණක සාක්ෂරතාවය සහ ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍යයි.
- **වයස**

  අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුයි.

### නියමයන් සහ කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර එම පුහුණු කාලසීමාව තුළදී රු. 75,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- බැංකුව සෑහීමකට පත් වන අයුරින් පුහුණු අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර සේවයේ සහකාර නීති නිලධාරී ශ්‍රේණියෙහි සේවය ස්ථිර කෙරේ.
- කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත / නිවාඩු දිනයන්හි සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

### තෝරා ගැනීමේ පටිපාටිය

ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("Careers" තීරය හරහා) 2021 අප්‍රේල් මස 03 දින හෝ ඊට පෙර එවිය යුතු අතර එම **"අයදුම්පතෙහි යොමු අංකය"** ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබා ගන්න.

**ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.**

**ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් රහිත හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ පටිපාටියේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**කොළඹ 01.**

*කුමන අයුරකින් හෝ බලපෑම් සිදු කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතු වනු ඇත.*
*තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ.*

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ